**#mediaethicsSL #SinhalaPress #lka #SundayMawbima #March25**

පුවත්පතක පළවන ලිපියක් සම්බන්ධයෙන් අනිවාර්යයෙන් අදාළ විය යුතු මාධ්‍ය ආචාර ධර්මයන් තිබේ. ඇතැම් විට මාධ්‍ය ආචාර ධර්මයන්ට හසුනොවෙනා සමාජ සදාචාරාත්මක සීමාවන්ද තිබේ. මෙම සියල්ල සමගින් එම ලිපිය කෙතරම් ගුණාත්මක භාවයෙන් ඉහළ වන්නේද යන කරුණ පිළිබඳවද අවධානය යොමුකළ යුතුවේ.

ඉරිදා මව්බිම පුවත්පතේ පළවූ මෙම ලිපිය උදාහරණයක් ලෙසින් ගත හැක. ප්‍රධාන වශයෙන්ම මෙහි කාන්තාව සම්බන්ධයෙන් සඳහන් වී ඇත්තේ ශිෂ්ට සමාජයට තරම් නොවනාකාරයකින්, ඇයව ලිංගික භාණ්ඩයක් ලෙසින් හුවාදක්වමිනි. මෙය මාධ්‍ය ආචාර ධාර්මික උල්ලංඝනයක් කරනා ලිපියක් පමණක් නොව, සාමාන්‍ය සමාජයේ ශිෂ්ටත්වයට පවා නොගැලපෙන ආකාරයට ලියැවී ඇති සටහනකි. මෙයට අමතරව එම ලිපියේ ගුණාත්මක තත්වයද කෙතරම් බාලදැයි කියන්නේ නම්, එය සංස්කාරකවරයෙකු හරහා නිරීක්ෂණයට ලක්වී ප්‍රකාශය වී ඇතිදැයි විමතියක් හටගැනෙනු ඇත. මෙවැනි ලිපියක වගකීම එය සම්පදනය කළ මාධ්‍යවේදියාට පමණක් නොව, පුවත්පතේ සංස්කාරකවරයාටත්, සමස්තයක් ලෙසින් පුවත්පතටත් අදාළ වන බව අවධාරණය කරමින් මෙම සටහන සමාප්ත කරමු.